# Operation Sovereign Borders

2013 සැප්තැම්බර් මස 07 වැනි දින ඔස්ට්‍රේලියාවේ නව රජයක් බිහි වූ අතර අගමැතිවරයා වශයෙන් ටෝනි ඇබොට් මහතා පත් විය. මුහුදු මඟින් අනවසර ලෙස රටට ඇතුළු වන පුද්ගලයන් පාලනය කිරීම සඳහා නව රජය විසින් 'ස්වෛරී දේශසීමා ක්‍රියාන්විතය' (OSB) නමින් දැඩි ප්‍රතිපත්තියක් අලුතින් හඳුන්වා දී ඇත.

**'ස්වෛරී දේශසීමා ක්‍රියාන්විතය (OSB)' නැමති අලුතින් හඳුන්වා දෙන ලද දැඩි ප්‍රතිපත්තිය කුමක්ද?**

ස්වෛරී දේශසීමා ක්‍රියාන්විතය ලෙස හඳුන්වනු ලබන්නේ, අපරාධකරුවන්ගේ ග්‍රහණයට හසු වී පුද්ගලයන් සිය ජීවිත මුහුද මැද පරදුවට තැබීම වැළැක්වීමට සහ ඔස්ට්‍රේලියානු ආගමන වැඩසටහන අඩුලුහුඬුවකින් තොරව ක්‍රියාත්මක කිරීම සඳහා හමුදා නායකත්වයකින් යුතුව ක්‍රියාත්මක කෙරෙන නව දේශසීමා ආරක්ෂණ වැඩසටහනයි.

**නව ප්‍රතිපත්තිය මීට පෙර පැවති ප්‍රතිපත්තියෙන් වෙනස් වන්නේ කෙසේද?**

අනවසරයෙන් මුහුදු මාර්ග ඔස්සේ රට තුළට ඇතුළුවන පුද්ගලයන්ගේ සරණාගත හිමිකම් පිළිබඳ විමසා බැලීම සඳහා පැපුවා නිව්ගිනි සහ නාවුරු වෙත යොමු කිරීමට අදාළව එම දෙරටේ රජයයන් සමග පවතින එකඟතාව තවදුරටත් ක්‍රියාත්මක වේ. නව ප්‍රතිපත්තිය යටතේ සරණාගතභාවය පතා ඔස්ට්‍රේලියාවට පැමිණෙන්නන් පැය 48ක කාල සීමාවක් තුළ දී කඩිනමින් පැපුවා නිව්ගිනි හෝ නාවුරු හෝ වෙත හරවා යැවීමේ ශීඝ්‍රගාමී වැඩපිළිවෙළක් ක්‍රියාත්මක කෙරේ. එම දෙරටේ ඇති සරණාගත හිමිකම් පිළිබඳ විමසා බැලීමේ මධ්‍යස්ථාන පුළුල් කිරීමත් බෝට්ටු මඟින් පැමිණෙන පුද්ගලයන් ආපසු යැවීමේ කාර්යය වේගවත් කිරීමත් නව ප්‍රතිපත්තියට ඇතුලත්ය.

**ඔස්ට්‍රේලියාව, පැපුවා නිව්ගිනි සහ නාවුරු අතර ක්‍රියාත්මක වන වැඩපිළිවෙළ කුමන ආකාරයේද?**

ඔස්ට්‍රේලියාව සහ පැපුවා නිව්ගිනි මෙන්ම ඔස්ට්‍රේලියාව සහ නාවුරු අතර අත්සන් තැබූ ගිවිසුම් තුළින් අනවසරයෙන් ඔස්ට්‍රේලියාව බලා පැමිණෙන පුද්ගලයන්ගේ සරණාගතභාවය විමසා බැලීම සඳහා ඔවුන් පැපුවා නිව්ගිනි හෝ නාවුරු හෝ වෙත යොමු කෙරෙන අතර ඔවුනට සරණාගතභාවය සඳහා හිමිකම් ඇති බව සනාථ වුවහොත් ඔවුහු නාවුරු හෝ පැපුවා නිව්ගනි යන රටවලම පදිංචි කරවනු ලැබෙති.

සරණාගතභාවය ලැබීමට නොසුදුසු බව ඔප්පු වන පුද්ගලයෝ ආපසු සිය රටවල් වෙත හෝ තමන්ට ජීවත් වීමේ අයිතිවාසිකම් ඇති රටක් වෙත ආපසු යවනු ලැබෙති.

## නව නීති

කලාපීය විමසා බැලීමේ මධ්‍යස්ථාන පුළුල් කිරීම සඳහා ඔස්ට්‍රේලියාව මේ වන විට පැපුවා නිව්ගිනි සහ නාවුරු රාජ්‍යයන් සමග සාකච්ඡා කරමින් සිටී. ඊට අමතර ව, මෙම මධ්‍යස්ථාන සඳහා තවත් ඉදිකිරීම් සිදුකිරීමට අවශ්‍ය ස්ථාන නිර්ණය කිරීමේ කටයුතු ද දැන් සිදු කෙරේ. මේ තුළින් අනවසරයෙන් බෝට්ටු මඟින් පැමිණෙන පුද්ගලයන් පිළිබඳ ඔස්ට්‍රේලියාවෙන් පිටත දී විමසා බැලීමේ පහසුකම් පුළුල් කෙරෙන අතර පැය 48 ක කාලයක් තුළ දී පුද්ගලයන් මාරු කර යැවීමේ ශීඝ්‍රගාමී වැඩපිළිවෙළ සාර්ථක කරගැනීමට ද ඉන් ඉඩ සැලසේ.

**පැය 48 ක කාලයක් තුළ පැපුවා නිව්ගිනි සහ නාවුරු රාජ්‍යයන් වෙත මාරු කර යැවීමේ වැඩපිළිවෙළ කාන්තාවන්ට සහ ළමයින්ට අදාළ වේ ද?**

නීති විරෝධී ලෙස ඔස්ට්‍රේලියාවට ඇතුළු වන සියලුම පුද්ගලයන් පැපුවා නිව්ගිනි සහ නාවුරු වෙත මාරුකර යවනු ලැබේ. එබැවින් මෙම මාරුකර යැවීමේ වැඩසටහනේ දී කාන්තාවන්ට සහ ළමයින්ට විශේෂත්වයක් හිමි නොවේ. ඔස්ට්‍රේලියාව වෙත වීසා නොමැති ව බෝට්ටු මඟින් පැමිණෙන කවරෙකුවුවත් ඔස්ට්‍රේලියාවේ රඳවා ගනු නොලැබේ.

**දෙමාපියන් හෝ බාරකරුවන් නොමැති ව පැමිණෙන බාලවයස්කරුවන් සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන ප්‍රතිපත්තිය කුමක්ද?**

ඔස්ට්‍රේලියාවෙන් පිටත පිහිටි සරණාගතභාවය විමසීමේ මධ්‍යස්ථානය වෙත මාරුකර යැවීමේ ප්‍රතිපත්තියේ දී කිසිදු අයෙකුට විශේෂත්වයක් නොලැබේ. නීති විරෝධී ලෙස දෙමාපියන් හෝ බාරකරුවන් නොමැතිව ඔස්ට්‍රේලියාවට පැමිණෙන බාලවයස්කරුවෝ ද පැපුවා නිව්ගිනි හෝ නාවුරු වෙත වෙත මාර කර යැවෙති. දෙමාපියන් හෝ බාරකරුවන් නොමැති බාලවයස්කරුවන් කලාපීය විමසීම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීමෙන් පසු ඔවුන්ගේ අවශ්‍යතා පිළිබඳ සොයා බැලීම සඳහා වැඩසටහනක් සකස් කිරීම සම්බන්ධයෙන් ඔස්ට්‍රේලියානු බලධාරීහු පැපුවා නිව්ගිනි සහ නාවුරු බලධාරීන් සමඟ මේ වන විට සමීප ව කටයුතු කරමින් සිටිති.

**ආපසු හැරෙන ලෙස බෝට්ටු වෙත නිවේදනය කෙරෙයිද?**

ඔස්ට්‍රේලියානු රජය වෙනස් වී ඇති අතර නීතිරීති ද එසේමය. වීසා නොමැති ව ඔබ බෝට්ටු මඟින් ඔස්ට්‍රේලියාව වෙත පැමිණෙන්නේ නම් මුහුද මැද දී ඔබගේ බෝට්ටු අල්ලා ගනු ලැබේ. ඒ අනුව ඔබව ආපසු හරවා යැවීම හෝ කඩිනමින් පැපුවා නිව්ගිනි හෝ නාවුරු විමසුම් මධ්‍යස්ථාන වෙත යොමු කිරීම සිදුකළ හැකිය. ඔබ කිසිදු ආකාරයකින් ඔස්ට්‍රේලියාව තුළ පදිංචි නොකෙරෙනු ඇත.

**ඔස්ට්‍රේලියාවේ පදිංචි වීම සඳහා මා හට අවස්ථාවක් ලැබෙනු ඇති බව පුද්ගල ජාවාරම්කරුවෝ මා හට පැවසූහ?**

පුද්ගල ජාවාරම්කරුවන්ගේ බොරුවලට නොරැවටෙන්න. ඔවුන් ඔබගේ මුදල් ඩැහැ ගැනීමට මාන බලමින් සිටින පිරිසකි. වීසා නොමැතිව බෝට්ටු මගින් ඔබ ඔස්ට්‍රේලියාව වෙත පැමිණෙන්නේ නම් ඔබගේ ජීවිතය ඇතුළුව ඔබගේ සියලුදේ ද ඔබට අහිමි වී යෑමට ඉඩ ඇත.

**ඥාතීන් දැනටමත් ඔස්ට්‍රේලියාවේ සිටී නම් අනුගමනය කෙරෙන ප්‍රතිපත්තිය කුමක්ද? ඥාතීන්ට දැනටමත් වීසා ලැබී ඇත්නම් මා සම්බන්ධයෙන් අනුගමනය කෙරෙන ප්‍රතිපත්තියේ වෙනසක් සිදු වන්නේද?**

බෝට්ටු මගින් පැමිණෙන පිරිසට, (දරුවන්, පවුල් හෝ දෙමාපියන් හෝ බාරකරුවන් නොමැතිව පැමිණෙන බාලවයස්කරුවන් ඇතුළුව) ඔවුන්ට සම්බන්ධ පවුලක් ඔස්ට්‍රේලියාවේ සිටියද අනුගමනය කෙරෙන ප්‍රතිපත්තියේ වෙනසක් සිදු නොවනු ඇත. ඔස්ට්‍රේලියාවට නීති විරෝධී ආකාරයෙන් බෝට්ටු මගින් ඇතුළු වන සියලුම පුද්ගලයන් පැමිණීමේ සිට පැය 48 ක කාලයක් තුළ පැපුවා නිව්ගිනි හෝ නාවුරු වෙත මාරු කර හරිනු ලැබේ.

**රැකවරණ පතා එන අය ඔස්ට්‍රේලියානු භූමියට පැමිණියහොත් ? පැපුවා නිව්ගිනි සහ නාවුරු රාජ්‍යයන් වෙත මාරු කර යැවීමේ වැඩපිළිවෙළ ඔවුන්ටත් අදාළ ද?**

රැකවරණ පතා බෝට්ටු මගින් පැමිණෙන ඕනෑම අයෙක් ඔස්ට්‍රේලියාවේ කුමන ප්‍රදේශයකට ලඟා වුවද ඔවුන්ව පැපුවා නිව්ගිනි සහ නාවුරු වෙත මාරු කර යවනු ලැබේ.

**සරණාගතයන් ලෙස තහවුරු නොවන පුද්ගලයන්ට සිදු වන්නේ කුමක්ද?**
සරණාගතයන් ලෙස තහවුරු නොවන පුද්ගලයන් සිය මව්රට වෙත වෙත හෝ රැඳී සිටීමට අයිතිවාසිකම් ඇති රටක් වෙත මාරු කර හරිනු ලැබේ.

**නව වැඩපිළිවෙළ යටතේ පැපුවා නිව් ගිනි හෝ නාවුරු වෙත යොමු කළ හැකි පුද්ගලයන් සංඛ්‍යාව කොපමණද?**
මාරුකර යැවිය හැකි උපරිම පුද්ගලයන් ප්‍රමාණය පිළිබඳ සීමාවක් නොමැත. පුද්ගලයන් රැඳවීම සඳහා දෙරටේම ඇති පහසුකම් දිගටම පුළුල් කෙරේ. නව වැඩපිළිවෙළ යටතේ පැපුවා නිව්ගිනි සහ නාවුරු වෙත මාරුකර හරිනු ලබන හෝ පදිංචි කරවනු ලබන පුද්ගලයන්ගේ සංඛ්‍යාව පිළිබඳ සීමාවක් නොමැත.

**ඔස්ට්‍රේලියාවේ හෝ වෙනත් කිසියම් රටක ස්ථිර පදිංචිය ලබා ගන්නේ කෙසේද?**
මේ සඳහා එක්සත් ජාතීන්ගේ සරණාගතයන් පිළිබඳ මහකොමසාරිස් කාර්යාලය (UNHCR) හෝ සංක්‍රමණිකයින් පිළිබඳ අන්තර්ජාතික සංවිධානයේ (IOM) පැහැදිලි පටිපාටියක් ඇති අතර එය අනුගමනය කරමින් අයදුම් කළ යුතුය.